දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/APP/13/5/3/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2022 අගෝස්තු මස 19 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>දීප ව්‍යාප්ත සේවාවල සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනෙකුත් සේවා ගණවල II හා III ශ්‍රේණිවල තනතුරුවල හා තෘතීයික මට්ටමේ අධි/විශේෂ ශ්‍රේණියේ තනතුරුවල වැඩබැලීමට/රාජකාරී ඉටුකිරීමට නිලධාරීන් පත් කිරීම.</u>

අංක 1941/41 දරන හා 2015.11.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල අභිනියෝජනය කිරීමේ නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඉහත නිවේදනයට අනුව දීපව්‍යාප්ත සේවාවල හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනෙකුත් සේවා ගණවල II හා III ශ්‍රේණිවල නිලධාරීන් හා තෘතීයික මට්ටමේ අධි/විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් ස්ථානමාරු කිරීමට අභිනියෝජිත බලය දරන බලධරයකුට, එකී යම් ශ්‍රේණියක තනතුරක් දරන නිලධරයෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල IX පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව එම ශ්‍රේණියේ ම වෙනත් තනතුරක වැඩ බැලීමට/රජකාරී ඉටු කිරීමට පත් කිරීමේ බලය ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

03. කෙසේ වෙතත් මාගේ අංක PSC/APP/HB/01/2022 දරන හා 2022.05.26 දිනැති ලිපියේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණයෙන් අවධාරණය කර ඇති පරිදි අංක 03/2022 දරන හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛනයේ විධිවිධාන සැලකිල්ලට ගෙන හැකි සෑම අවස්ථාවක දීම පුරප්පාඩු තනතුරුවලට වැඩබැලීමේ/ රාජකාරී ඉටුකිරීමේ පත්කිරීම් සිදුකිරීම වෙනුවට සුදුසු නිලධාරීන් ලවා එම තනතුරුවල රාජකාරී ආවරණය කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

04. තව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අන් අයුරකින් නියම කර නොමැති නම් දීපව්‍යාප්ත සේවාවල හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනෙකුත් සේවා ගණුවල I ශ්‍රේණියේ තනතුරුවලට සිදුකෙරෙන සියලු වැඩබැලීමේ/ රාජකාරී ඉටු කිරීමේ පත්කිරීම් මෙන්ම ඉහත අංක 02 ඡේදයේ සඳහන් නිලධාරී ගණුවල යම් තනතුරක් දරන නිලධරයෙකු, තමන් දරන තනතුර අයත් ශ්‍රේණියට ඉහළ ශ්‍රේණියක / සේවා මට්ටමක තනතුරක වැඩබැලීමට/ රාජකාරී ඉටු කිරීමට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පමණක් සිදුකළ යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව